# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/ 88 /2024 (PSC)**

ඊ.ඒ.නිලන්ති ලිලානි
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.01.20**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක පුද්ගලිකව පෙනී සිටී
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් මනේෂා නිශ්ශංක මිය.

**-<u>නියෝගය</u>-**

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

මෙම කරුණ සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින් ම ඉදිරිපත් කරන ලද ලිඛිත හා වාචික දේශන සළකා බලන ලදි. ඉදිරිපත් කර ඇති ලේඛන අනුව පෙනී යන්නේ, අභියාචක දැනට සේවය කරන පාසලේම තවදුරටත් සේවය කිරීමට ඇය විසින් ඉල්ලා සිටින බවයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද කරුණු වල සඳහන් කර ඇත්තේ, අභියාචක මෙම පාසලේ වසර 23ක කාලයක් සේවය කර ඇති නිසා, ඇය මෙම ස්ථානයෙන් වෙනත් පාසලකට ස්ථානමාරු කිරීමට තීරණය කරන ලද බවයි. එසේ කරන ලද්දේ වාර්ෂික ස්ථානමාරු පටිපාටිය අනුගමනය කරමින් අනතුරුව වන හෙයින්, අභියාචකගේ ඉල්ලීමට ඉඩදුනහොත්, එම ස්ථානමාරු චක්‍රය තුළ සිටින අනුප්‍රාප්තිකයින්ට අගතියක් සිදුවන නිසා බවට, තවදුරටත් සඳහන් කර ඇත. එබැවින් අභියාචකගේ ඉල්ලීමට අවසර

නොදිය යුතු බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරුණු ඉදිරිපත් කර ඇත.

ඉහතින් සඳහන් කරන ලද වාර්ෂික ස්ථානමාරු පටිපාටිය අනුගමනය කිරීමේ ක්‍රමවේදය ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතුය යන කරුණේ වැදගත්කම සහ එහි අවශ්‍යතාවය කෙරෙහි විනිශ්චය අධිකාරයේ විශේෂ අවධානය යොමු කරන ලදි. එය එසේ වුවත්, එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් ඉදිරිපත් වන විශේෂිත කරුණු සළකා බලමින් සුදුසු නියෝගයන් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වගකීම වනවා ඇත. එබැවින් අභියාචක විසින් ඉදිරිපත් කර ඇති විශේෂිත කරුණු මොනවාද යන්න කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදි. එකී විශේෂිත කරුණු පැහැදිලි ලෙසට දිවිරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කරන ලෙස, විනිශ්චය අධිකාරය විසින් අභියාචක වෙත දැනුම් දෙන ලදි.

ඒ අනුව අභියාචක විසින් 2025.12.25 දිනැතිව, ප්‍රතිඥා දී ප්‍රකාශ කර ඇති දිවිරුම් ප්‍රකාශයේ ඇතුළත් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදි. එහි ඇතුළත් කරුණු අතරින්, ඇයගේ වයස සහ ඇය දැනට පෙළෙන රෝගී තත්ත්වයන් සම්බන්ධයෙන් වන කරුණු වලට අවධානය යොමු කරන ලදි. මේ වන විට ඇය අවුරුදු 58කට ආසන්න වූ කාන්තාවකි. එසේම ඇය ආතරයිටීස් රෝගී තත්ත්වයෙන් පෙළෙන බවත්, ඇවිද ගැනීමට පවා අපහසු තත්ත්වයට පැමිණ ඇති බවත්, ඇයගේ දනහිස් දෙකම ගෙවී ඇති බැවින්, ඒවා සැත්කමක් මගින් අලුතින් දැමිය යුතු බවටත්, ඇය පවසා ඇත. එම තත්ත්වය සනාථ කිරීම සඳහා ඇය විසින් විශේෂඥ වෛද්‍ය කපිල සමරසේකර යන අය විසින් නිකුත් කර ඇති වෛද්‍ය සහතිකයක් ද ඉදිරිපත් කර ඇත. එම වෛද්‍ය සහතිකයේ සඳහන් වන්නේ, අභියාචක ඔස්ටියෝ ආතරයිටීස් රෝගයෙන් පෙළෙන බවත්, ඇයගේ දකුණු දණහිස අලුතින් සවි කිරීමට සිදුව ඇති බවත්ය. එම කරුණු තවදුරටත් තහවුරු කිරීමට සඳහා, එම වෛද්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇති තවත් වෛද්‍ය වාර්තා කිහිපයක්ම ඇය විසින් ඉදිරිපත් කර ඇත.

එකී දිවිරුම් ප්‍රකාශයේ තවදුරටත් සඳහන් කර ඇත්තේ වයස අවුරුදු 24ක් වයසැති ආබාධිත පුතෙක් ඇයට සිටින බවයි. ඔහු මාස 09ක සිටම, දිගින් දිගටම අපස්මාර රෝගයෙන් පෙළෙන නිසා, ස්නායුද දුර්වල වී ඇති බවටත් එහි සඳහන් කර ඇත. එම තත්ත්වය තහවුරු කිරීමට වෛද්‍ය සුසන්තා හේරත් යන අය විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතික සහ දරුවාට ලබා දී ඇති වෛද්‍ය ප්‍රතිකාර දක්වෙන, පේරාදෙනිය ශික්ෂණ

රෝහලෙන් නිකුත් කරන ලද වෛද්‍ය වාර්තා ද ඇය විසින් ඉදිරිපත් කරන ලද දිව්රුම් ප්‍රකාශයට අමුණා ඇත. දිව්රුම් ප්‍රකාශය මගින් ඉදිරිපත් කර ඇති එම කරුණු ප්‍රතික්ෂේප කළ නොහැක.

ඉහත කී රෝගී තත්ත්වයෙන් පෙළෙන අභියාචක හා ඇයගේ දරුවා සම්බන්ධයෙන් වන සෞඛ්‍ය තත්ත්වය මෙහිදී විශේෂයෙන් සළකා බැලිය යුතු කරුණක් වනවා ඇත. අභියාචක ස්ථාන මාරු කර ඇති ස්ථානය පිහිටා ඇත්තේ, ඇය පදිංචි නිවසේ සිට කි.මී.37ක් පමණ දුරින් වන බවටත් එකී දිව්රුම් ප්‍රකාශයේ සඳහන් කර ඇත. එවැනි තත්ත්වයක් යටතේ ඇය විසින් ඉදිරිපත් කරන ලද ඉහත කී කරුණු නොසළකා හැරිය නොහැක.

මේ අවස්ථාවේ දි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024.07.15 සහ 2015.12.17 දිනැතිව ඉදිරිපත් කරන ලද වාර්තා දෙකෙහිම ඇතුළත් කරුණු කෙරෙහි ද විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදි. එහි ප්‍රධාන වශයෙන්ම සඳහන් කර ඇත්තේ, අභියාචක දීර්ඝ කාලයක් මෙම පාසලේ සේවය කර ඇති බැවින් ඇය ස්ථානමාරු කිරීමට යටත් කරන ලද බවයි. ඇයගේ ඉල්ලීම අනුව ස්ථාන මාරුව අවලංගු නොකළ හැක්කේ, අනුප්‍රාප්තිකයන් ගලපමින් සිදුකරන සංකීරණ ක්‍රියාවලියක් තුළ, එම චක්‍රයේ සිටින අනිකුත් අනුප්‍රාප්තිකයන් අගතියට පත්වීම නොවැළැක්විය හැකි නිසා බවයි.

ඉහත කී වාර්තා දෙකෙහිම සඳහන් එකම කරුණ එය පමණකි. නමුත් ඉහත කී 2025.12.17 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එවා ඇති වාර්තාවෙහි සඳහන් කර ඇත්තේ, අභියාචක සේවය කරන ස්ථානයේ, ඇය අයත්වන ලේඛන සහකාර තනතුරේ අනුමත තනතුරු සංඛ්‍යාව දෙකක් වන බවත්, එම තනතුරු සඳහා අභියාචක පමණක් එම පාසලේ සේවය කරන බවත් ය. එම තත්ත්වය තහවුරු කිරීම සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද 2025.05.09 දිනැති ලිපියද ඉහත කී වාර්තාවට අමුණා ඉදිරිපත් කර ඇත. එයින් පෙනී යන්නේ අභියාචක මෙම පාසලෙන් ස්ථානමාරු කළහොත්, අදාළ තනතුර සඳහා එම පාසලේ ම පුරප්පාඩු දෙකක් පවතින බවයි. එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් අයෙකු ස්ථානමාරු කර තිබෙන බවකටද කරුණු ඉදිරිපත් නොවේ. එවැනි තත්ත්වයක් යටතේ කොමිෂන් සභා වාර්තාවේ දක්වා ඇති පරිදි, ස්ථානමාරු ගැලපීමකට අභියාචකගේ ඉල්ලීම බාධාවක් වන බවක් ද නොපෙනේ.

ඉහත කරුණු සළකා බැලීමෙන් අනතුරුව, **2023.11.28** දිනැතිව වාර්ෂික ස්ථානමාරු තීරණ මගින් අභියාචක වෙත ලබා දී ඇති ස්ථානමාරුව අවලංගු කිරීමට තිරණය කරමු.

ඒ අනුව අභියාචකට මෙම පාසලේම ඇය විශ්‍රාම යන දින දක්වා තවදුරටත් සේවය කිරීමට අවසර ලබා දෙන ලෙසට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නියෝග කරමු.

ඉහත නියෝගය ක්‍රියාත්මක කිරීමට සුදුසු පියවර ගන්නා ලෙසට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු.

ඉහත කරුණු සළකා බලා අභියාචකගේ ඉල්ලීමට අවසර ලබාදෙමු.

අභියාචනයට අවසර ලබාදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-